දෙවිනුවර ප්‍රාදේශීය සභාව

දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අවම සුදුසුකම් ඇති දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගේ පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. දැනටමත් දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ අනියම්, ආදේශක, කොන්ත්‍රාත්, තාවකාලික හා සහන පදනම මත සේවයේ නියුක්ත අයට ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

උපලේඛනය

තනතුර	*තනතුරු සංඛ්‍යාව*	*වැටුප් කේත අංකය*	*වැටුප් පරිමාණය (මාසික)*	*අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්*
(01) සංඛ්‍යා කම්කරු (III පන්තිය)	04	PL1 / 2016	රු. 24,250 - 10 x 250 - 10 x 270- 10 x 300 - 12 x 330 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)	08 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම.
(02) වැඩ ක්ෂේත්‍ර කම්කරු (III පන්තිය)	01	PL1 / 2016	රු. 24,250 - 10 x 250 - 10 x 270- 10 x 300 - 12 x 330 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි)	08 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම.

අවශ්‍ය අනෙකුත් සුදුසුකම් හා පොදු කොන්දේසි :

1. රජයේ හෝ රජයේ සංස්ථාවක සේවයේ සිට අකාර්යක්ෂමතාව මත අනිවාර්ය විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ සේවයෙන් පහකිරීම වෙනුවට සානුකම්පිත විකල්පයක් ලෙස විශ්‍රාම ගන්වා ඇත්තාවූ හෝ දඬුවමක් වශයෙන් විශ්‍රාම ගන්වා ඇත්තා වූ හෝ විධිමත් විනය පරීක්ෂණයක් මත සේවයෙන් පහකර ඇත්තාවූ සිය තනතුරු අත්හැර ගියා වූ හෝ තැනැත්තෙක් නොවිය යුතුය.
2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට විරුද්ධව සිදුකරන ලද සාපරාධී වරදකට අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙකු නොවිය යුතුය.
3. යම් අපරාධ නීති කෘත්‍යයකදී අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූ හෝ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 449 වගන්තිය ප්‍රකාරව අධිකරණයේ දී ලඝු නඩු විභාගයකින් වරදකරු කරනු ලැබූ තැනැත්තෙක් නොවිය යුතුය.
4. වස්තු භංගත්වයට පත්වී ඇති තැනැත්තෙකු නොවිය යුතුය.
5. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
6. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතුය.
7. 2018.09.28 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
8. අයදුම්පත භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03 ක කාලයක් තුළ දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (පදිංචි වසමේ ග්‍රාම නිලධාරියා විසින් නිකුත් කරන ලද පදිංචි සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් අනුමැතිය තබා පදිංචිය සනාථ කළ යුතුය.)
9. මෙම බඳවා ගැනීම අයදුම්පත් කැඳවන අවස්ථාවේදී හෝ ඊට පසුව අතරමගදී හෝ අහහැර දැමීමට දෙවිනුවර ප්‍රාදේශීය සභාවට බලය ඇත.

විශේෂ සුදුසුකම් :

අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර 03ක කාලයක් තුළ දෙවිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු වීම.

බඳවා ගැනීමේ ක්‍රමය :

අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම් කරනු ලැබේ.

සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :

(01) දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරුවලට අදාළ බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලවය.

ඉල්ලුම් කළ යුතු ආකාරය :

මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි ඒ4 ප්‍රමාණයේ කොළයක සකස් කරන ලද අයදුම්පත් 2018.09.28 වැනි දිනට පෙර ලැබෙන සේ "සභාපති, දෙවිනුවර ප්‍රාදේශීය සභාව, දෙවිනුවර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එසේ නොමැති නම් දෙවිනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම් වෙත අතින් භාර දී එය භාරදුන් බවට සනාථකර ගත හැකිය. අයදුම්පත් බහාලන කවරයේ ඉහල වම්පස කෙළවරේ ..... (ඉල්ලුම් කරන තනතුරේ නම) තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතුය.

සුජීව වෙදගේ,
සභාපති.

2018 අගෝස්තු මස 17 වැනි දින,
දෙවිනුවර ප්‍රාදේශීය සභාව,
දෙවිනුවර.

අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික හෝ පාසල් හැරයාමේ සහතිකය,
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
4. මෑතකදී ලබාගත් ග්‍රාමනිලධාරී සහතිකය,
5. මෑතකදී ලබාගත් චරිත සහතික 2ක්,
6. වෙනත් සුදුසුකම් හෝ සේවා පලපුරුද්ද පිළිබඳ සහතික,
7. විශේෂ සුදුසුකම් පිළිබඳ සහතික

ආදර්ශ අයදුම් පත්‍රය

දෙවිනුවර ප්‍රාදේශීය සභාව - දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුර සඳහා බඳවා ගැනීම 2018 ..... තනතුර

01. *(අ)* මුලකුරු සමග නම :——————————————————.

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම :——————————————————..

02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————————.

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසය :——————————————————.

04. ස්ථිර ලිපිනය :——————————————————.

05. ස්ත්‍රී/ පුරුෂ භාවය :——————————————————.

06. විවාහක/ අවිවාහක බව :——————————————————.

07. උපන් දිනය :——————————.

2018.09.14 දිනට වයස අවු :——————. මාස :——————— දින :———————

08. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————————.

09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින්ද? ලියාපදිංචි වීමෙන්ද:——————————.

10. අධ්‍යාපන සුදුසුකම් :——————————————————.

11. වෙනත් සුසුකම් :——————————————————.

12. වෘත්තීය සුදුසුකම් :—————————————————————.

13. විශේෂ සුදුසුකම් :—————————————————————.

14. සේවා පළපුරුද්ද :

I. දැනට සේවය කරන ආයතනය :—————————————————.

II. දැනට දරන තනතුර :—————————————————.

III. ඔබ තනතුරට පත් වූ දිනය :—————————————————

IV. මීට පෙර සේවය කරන ලද ස්ථානය හා දරන ලද තනතුර :—————————————————

15. අධිකරණය ඉදිරියේ ඔබ වරදකරුවකු වී ඇද්ද? / ඔව් / නැත :—————————————————

මෙහි සඳහන්කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇතොත් මා තෝරා ගැනීමෙන් පසුව ඒ බැව් හෙළි වුවහොත් සේවයෙන් පහකිරීමට යටත්වන බව මම දනිමි.

.....

දිනය :..... අයදුම්කරුගේ අත්සන.